**පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

-----------------------------------------------------------------------------

පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල සඳහා රජයේ නියෝජිතායතනය වන කොරියානු අපනයන හා ආනයන බැංකුව (එක්සිම් බැංකුව ) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර 2008 දෙසැම්බර් 19 දින එළඹි ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදලේ (ඊඩීසීඑෆ්) අංක එස්ආර්අයි-18 දරන ණය ගිවිසුම යටතේ පාදෙණිය සිට අනුරාධපුර මාර්ගය දක්වා කිලෝමීටර් 80.8 ක් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන්නේ පිළිවෙලින් මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය (වමමාඅ) සහ මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රයේ පිහිටා ඇති පාදෙණිය - අනුරාධපුර මාර්ගයේ මාර්ග කොටස වැඩිදියුණු කිරීම මඟින් ප්‍රදේශ අතර භාණ්ඩ හුවමාරුව හා මහජන සම්බන්ධතා ක්‍රියාත්මක කිරීමට මෙන්ම ජාතික ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ සමාජ පිරිවැය කපාහැරීම සහ කර්මාන්ත තරඟකාරිත්වය ඉහළ නැංවීම මඟින් ප්‍රාදේශීය සංවර්ධනය සමතුලිත කිරීම සහ (ආ) කටුනායක - පාදෙණිය මාර්ග කොටසට මාර්ගය සම්බන්ධ කිරීමටද සැලසුම් කිරීමයි. එසේම කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ සංස්කෘතික උරුමයන්ගෙන් හා සංචාරක ආකර්ෂණයෙන් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත අතර මගී ප්‍රවාහන පහසුකම් ඇති කරලීම මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි ජාත්‍යන්තර තරඟකාරිත්වය ශක්තිමත් කිරීමටද අපේක්ෂා කෙරේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,670 ක් වන අතර ඉන් එජඩො මිලියන 55 කට සමාන රු.මිලියන 7,554.03 ක මුදලක් මූල්‍යායනය කිරීමට ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල එකඟවී තිබුණි. 2012 නොවැම්බර් මාසයේදී රු.මිලියන 1,232.90 කට සමාන එජඩො මිලියන 11.32 ක පරිපූරක ණයකින් ආරම්භක ණය මුදල වැඩිකර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2009 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2012 ජනවාරි 01 දින වන විට මාස 30 ක් තුළ නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු 2012 නොවැම්බර් 30 දින නිමකර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත්

කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුනු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

----------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

-----------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.2,188,658,160 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.10,579,689,658 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | - | 8,200 | 92,286 |
| සිවිල් වැඩ | 335,278,224 | 4,783,790,852 | 9,557,525,894 |
| උපදේශක සේවා | 103,290,530 | 263,565,997 | 751,641,073 |
| ඉඩම් අත්කර ගැනීම් | 48,140,662 | 20,738,261 | 136,202,250 |
| පරිපාලන පිරිවැය | 11,599,286 | 27,943,267 | 120,767,821 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම | - | - | 1,470,365 |
| | **2,188,658,160** | **3,011,540,536** | **10,579,689,658** |

## 5. විගණන නිරීක්ෂණ

----------------------

### 5.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

වෙනත් ව්‍යාපෘති තුනක් සඳහා වෙන්කරන ලද කාර්යයන් සිදුකිරීම සඳහා ව්‍යාපෘතිය විසින් වැය කරන ලද රු.11,927,969 ක මුදලක් මෙම ව්‍යාපෘතිය විසින් දරන ලද පිරිවැය ලෙස සලකා තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව ව්‍යාපෘති මූල්‍යයනය, අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | 2013 වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල | 66.32 | 8,786.93 | 1,517.47 | 1,517.47 | 9,292.15 |
| ශ්‍රී ලංකා රජය | - | 2,115.97 | 659.33 | 671.18 | 1,286.85 |
| එකතුව | 66.32 | 10,902.90 | 2,176.80 | 2,188.65 | 10,579.00 |

## 7. කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිපූරක ණය ගිවිසුමේ විධිවිධාන සලසා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් දරන ලද විදේශ විනිමය පාඩුව හිලව් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් රු.431,403,850 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි. එයට අමතරව, හිමිකම් ඉල්ලීම නිරවුල් කිරීමේදී වූ ප්‍රමාදයන් හේතුවෙන් රු.13,475,520 ක් වූ මූල්‍ය ගාස්තුද ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(ආ) මාර්ග ප්‍රතිසංස්කරණ වැඩ පිළිබඳ මුල් ප්‍රමාණ පත්‍රවල රු.329,129,118 ක් වටිනා විචලනයන් නිරීක්ෂණය විය. තවද ආරම්භක අදියරේදී මාර්ගයේ විධිමත් බිම් සමීක්ෂණ සිදුකළේ නම්, එම විචලනයන් අවම කිරීමට හැකිව තිබූ බව අනාවරණය විය. මීට අමතරව, ආරම්භක කොන්ත්‍රාත් ගිවිසුමේ මිල අසම්භාව්‍යයන් සඳහා වෙන්කරන ලද රු.152,306,769 ක වෙන්කිරීම් ආරම්භක ප්‍රමාණ පත්‍රවල මිල කැඳවීම වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු.270,442,407 ක් දක්වා වැඩිකර තිබුණි.

## 8. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංශෝධිත කාර්ය වැඩ සටහන අනුව, මාර්ග වැඩි දියුණු කිරීම් වැඩ 2012 නොවැම්බර් 30 දින නිම කර තිබුණද, ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය විසින් රු.48,140,662 ක මුදලක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් දරන ලද සමුච්චිත වියදම 2013 දෙසැම්බර් 31 දිනට රු.136,202,250 ක් විය.

(ආ) ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කරන ලද විස්තර අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 ක රජයේ ඉඩම් ඇතුළුව ඉඩම් කොටස් 1744 ක් අත්කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද ඉඩම් කොටස් 426 ක් සඳහා පමණක් 2013 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවා තිබුණි. මෙයින් ඉඩම් කොටස් 15 ක් පමණක්, ඉඩම් අත්පත් කර ගැනීම් පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි.

(ඇ) ඉඩම් අයිතිකරුවන් සඳහා වන්දි ගෙවීමේදී ප්‍රමාදයන් හේතුවෙන් රු.1,457,689 ක පොලී මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවීමට සිදුවී තිබුණි.

(ඈ) මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය ලේකම්ගේ 2009 ජුනි, අංක 01/2009 දරන චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතිය යටතේ ඉඩම් පත්පත් කර ගැනීමේ කටයුතු වල යෙදී සිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයට එකතුව රු.205,550 ක් වූ දිරිදීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. කෙසේ වුවද ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් සඳහා රු.12,500 ක මාසික දීමනාවක් සහිතව නිලධාරීන් 07 දෙනෙකු ව්‍යාපෘතිය විසින් පත් කර තිබූ බවත්, සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.737,500 ක දීමනා ඔවුන්ට ගෙවා තිබූ බවත් නිරීක්ෂණය විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් යොදවා තිබුණු නිලධාරීන්ට අමතරව ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් අතිරේක කාර්ය මණ්ඩලය පත් කිරීමේ හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.